# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

**සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය**
**சமூக வலுவூட்டல் அமைச்சு**
**MINISTRY OF SOCIAL EMPOWERMENT**


| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>**My No** DSD/HO/07/SD/05/01//SK | ඔබේ අංකය<br>உமது இல<br>**Your No** ........................................... | දිනය<br>திகதி<br>**Date** 2018.10.02 |

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂජනරාල්වරුන්,

සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන් වෙත,

**<u>සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය ජාතික තරඟාවලිය - 2018</u>**

සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය තරඟාවලිය සම්බන්ධයෙන් ඔබ වෙත යොමුකළ සමාංක හා 2018.03.21 දිනැති ලිපිය හා බැඳේ.

02. මෙවරද සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය ජාතික තරඟාවලිය **<u>පහත සඳහන් දිනවලදී බත්තරමුල්ල ශ්‍රී සුභූති ජාතික පාසලේදී හා ලංකා සභා පාසලේදී</u>** පැවැත්වීමට කටයුතු සූදානම් කර ඇත. ඒ අනුව සියලුම තරඟකරුවන් පෙ.ව. 8.00 ට පෙර බත්තරමුල්ල ශ්‍රී සුභූති ජාතික පාසලේ මෙහෙයුම් මැදිරියට වාර්තා කළ යුතුය.

**2018 ඔක්තෝබර් මස 27 වන සෙනසුරාදා - දමිළ මාධ්‍ය තරඟාවලිය**

**2018 නොවැම්බර් මස 03 වන සෙනසුරාදා - සිංහල මාධ්‍ය තරඟාවලිය**

03. සියලු තරඟ ඉසව්වලින් දිස්ත්‍රික් මට්ටමින් ප්‍රථම ස්ථාන ලබාගත්, ඔබ විසින් මේ වන විටත් අප වෙත යොමුකර ඇති නාම ලේඛනයේ සඳහන් තරඟකරුවන් පමණක් (ළමා කතන්දර හැර) අදාල දිනවලදී සහභාගි විය යුතු වේ. තරඟාවලිය පැවැත්වීම සම්බන්ධව නිකුත් කළ ඉහත ලිපියේ සඳහන් උපදෙස් පරිදි මෙම ජාතික තරඟාවලිය පවත්වනු ලබන අතර විනිශ්චය මණ්ඩලයේ තීරණය අවසන් තීරණය වේ. තරඟාවලිය පැවැත්වීමෙන් සති 2 ක් ඇතුලත දිස්ත්‍රික් වෙත ප්‍රතිඵල නිකුත් කරනු ලැබේ.

04. තරඟකරුවන්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා උප්පැන්න සහතිකයේ සහතික කළ පිටපතක් සමග සමෘද්ධි බැංකු ළමා ගිණුමේ පාස්පොත නොවරදවාම ඉදිරිපත් කළ යුතු ය.

05. ජාතික තරඟාවලිය සඳහා දිස්ත්‍රික් ප්‍රතිඵල ලේඛනය අනුව අදාල තරඟකරුවන් හා සහාය වාදන ශිල්පීන් හැරුණු විට දිස්ත්‍රික් නියෝජනය පහත පරිදි විය යුතුය.

| | |
|---|---|
| සමාජ සංවර්ධන විෂය කළමනාකරු ඇතුළු කළමනාකරුවන් | 02 |
| සමාජ සංවර්ධන සහකාර නිලධාරීන් ඇතුළු සහය නිලධාරීන් (දිස්ත්‍රික් සමාජ සංවර්ධන සහකාර ඇතුළු තරඟකරුවන් ඉදිරිපත්වන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල සමාජ සංවර්ධන සහකාරවරුන්ට ප්‍රමුඛත්වය ලබාදිය යුතුය.) | 13 |
| කණ්ඩායම් තරඟ සඳහා එක් කණ්ඩායමකට සහාය කටයුතු සඳහා දෙදෙනෙකු බැගින්( දෙමාපියන් හෝ වෙනත් උපරිම සංඛ්‍යාව) | 08 |


**1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla**

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන)<br>பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்)<br>Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

**6. තරඟාවලිය සම්බන්ධ පහත කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමුකළ යුතුය.**

6.1 තරඟ පැවැත්වෙන පාසල්වල නීති රීති හා විනිශ්චය මණ්ඩල උපදෙස් අනුව නම්කර එවන අය හැර වෙනත් කිසිවකුට පාසල් භූමියට ඇතුළු වීමට අවසර නොලැබේ.

6.2 ඔබ විසින් දිස්ත්‍රික්කයෙන් තරඟයට සහභාගී වන තරඟකරුවන්ගේ, සහාය වාදන ශිල්පීන්ගේ, නිලධාරින්ගේ හා කණ්ඩායම් තරඟ සඳහා සහාය දැක්වීමට අමතරව සහභාගී වන අයගේ නාම ලේඛනය ඇමුණුම් අංක 01 හා ඇමුණුම් අංක 02 අනුව සිංහල හා දෙමළ මාධ්‍ය සඳහා වෙන වෙනම 2018.10.10 වන දිනට පෙර නොවරදවා socialdev@divineguma.gov.lk විද්‍යුත් තැපැල මගින් අප වෙත යොමුකළ යුතුවේ.

6.3 ඔබ විසින් එවන නාම ලේඛනය අනුව පාසල් භූමියට ඇතුළු වන සියලු දෙනා සඳහා අවසරපත්‍රයක් නිකුත් කරනු ලබන අතර නාම ලේඛනයේ නම සඳහන් නොමැති කිසිවකුටත් අවසර පත්‍ර නිකුත් කරනු නොලැබේ. එම අවසර පත්‍රය නොමැති කිසිදු අයකුට (තරඟකරුවන්ට ද අදාලවේ) පාසල් භූමියට ඇතුල් වීමට අවස්ථාව නොලැබෙන බැවින් 6.2 හි පරිදි ඔබ දිස්ත්‍රික්කයෙන් සහභාගීවන සියලු දෙනාගේ විස්තර දන්වා එවීම අනිවාර්ය වේ.

6.4 දිස්ත්‍රික්කයෙන් ඉදිරිපත් වන සියලුම තරඟකරුවන්ට අදාල සියලු සම්බන්ධීකරණ කටයුතු සඳහා සුදුසු නිළධාරීන් පත්කර ගැනීමට කටයුතු කළ යුතු වේ.

6.5 කිසිදු තරඟකරුවකු ඉහත සඳහන් කළ පරිදි නිලධාරීන්ගේ භාරකාරිත්වයකින් තොරව තරඟාවලියට සහභාගී නොවිය යුතුය.

6.6 පාසලේ පවිත්‍රතාවය රැකීම, පාසලේ දේපල ආරක්ෂා වන පරිදි දරුවන් හැසිරවීමේ වගකීම පැමිණෙන නිලධාරින් සතුවන අතර කෙටි නාට්‍ය තරඟ සඳහා රැගෙන එන සියලුම වේදිකා සැරසිලි හා අමතර උපකරණ නැවත රැගෙන යාම සම්බන්ධයෙන් තරඟකරුවන් දැනුවත් කිරීම සිදුකළ යුතු අතර පැමිණෙන නිලධාරීන් ඒ සම්බන්ධව දැඩිව අවධානය යොමුකළ යුතුවේ.

6.7 ප්‍රධාන කාර්යාලයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණයට සම්බන්ධ වන නිළධාරීන් පිළිබඳ විස්තර ඇමුණුම් අංක 03 හි දැක්වෙන අතර ඒ අනුව තරඟාවලියට පෙර හා තරඟාවලිය අතරතුර අදාළ නිළධාරීන් හා සම්බන්ධීකරණය කරගත යුතුය.

6.8 තරඟාවලිය සම්බන්ධ පොදු විස්තර ඇමුණුම් අංක 04 හි දැක්වේ.

07. තව ද තරඟාවලියට සහභාගී වන්නන් සඳහා අවශ්‍ය වියදම් දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය මත දිස්ත්‍රික්කය තුළ වන සමාජ සංවර්ධන පදනම් වලින් / 2017,2018 කොඩි වැඩසටහනෙහි අරමුදල් මගින් වැය දැරීමට කටයුතු කළ යුතුය.

08. ඉහත දිනවලදී ඔබගේ සහභාගිත්වය අපේක්ෂා කරන අතර තරඟකරුවන් 3,000 කට අධික සංඛ්‍යාවක් සහභාගී වන මෙම තරඟාවලිය සාර්ථක කරගැනීම සඳහා ඔබගේ හා කාර්ය මණ්ඩලයේ සහයෝගය කාරුණිකව අපේක්ෂා කරමි.

නිමල් කොටවෙලගෙදර
අධ්‍යක්ෂ ජනරාල්(රා.ආ.)

පිටපත - සියලුම අංශ ප්‍රධානීන්, - කරු.දැ.ගැ.ස හා අවශ්‍ය සහයෝගය ලබාදීම සඳහා
සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව

ඇමුණුම් අංක **01**

**<u>සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය ජාතික තරඟාවලිය - 2018</u>**

**<u>2018.10.27 දින දෙමළ හා 2018.11.03 දින සිංහල මාධ්‍ය තරඟාවලිය සඳහා</u>**

**<u>සහභාගිවන නිලධාරි නාම ලේඛනය</u>**

දිස්ත්‍රික්කය - ..................................

දිස්ත්‍රික්කයෙන් සහභාගි වන තරඟකරුවන් සංඛ්‍යාව

(දිස්ත්‍රික්කය මගින් ලබාදී ඇති ප්‍රතිඵල ලේඛනය අනුව) -

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර | දුරකථන අංකය | නිලධාරියා වෙත පැවරී ඇති වගකීම |
|---|---|---|---|---|
| 01 | | | | සංග්‍රහ කටයුතු සම්බන්ධීකරණය |
| 02 | | | | |
| 03 | | | | සරල ගී ගායනය |
| 04 | | | | ජන ගී ගායනය |
| 05 | | | | ශාස්ත්‍රීය ගායනය |
| 06 | | | | ශාස්ත්‍රීය වාදනය |
| 07 | | | | උඩරට නැටුම් |
| 08 | | | | පහතරට නැටුම් |
| 09 | | | | කථික |
| 10 | | | | නිවේදක |
| 11 | | | | ජන නැටුම් 07-10 |
| 12 | | | | ජන නැටුම් 11-14 |
| 13 | | | | ජන නැටුම්15-18 |
| 14 | | | | කෙටි නාට්‍ය |
| 15 | | | | ගද්‍ය රචනා<br>පද්‍ය රචනා<br>චිත්‍ර |

සකස් කළේ

..................................................

දිස්ත්‍රික් සමාජ සංවර්ධන කළමනාකරු

අනුමත කළේ

.....................................

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

ඇමුණුම් අංක **02**

**<u>සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය ජාතික තරඟාවලිය - 2018</u>**

**<u>2018.10.27 දින දෙමළ හා 2018.11.03 දින සිංහල මාධ්‍ය තරඟාවලිය සඳහා සහභාගිවන නාම ලේඛනය</u>**

දිස්ත්‍රික්කය - ..................................

දිස්ත්‍රික්කයෙන් සහභාගි වන තරඟකරුවන් සංඛ්‍යාව -

| අනු අංකය | තරඟ අයිතමය | සහාය වාදන ශිල්පීන්ගේ නම | |
|---|---|---|---|
| 01 | ශාස්ත්‍රීය ගායනය | | |
| 02 | | | |
| 03 | ශාස්ත්‍රීය වාදනය | | |
| 04 | | | |
| 05 | උඩරට නැටුම් | | |
| 06 | | | |
| 07 | පහතරට නැටුම් | | |
| 08 | | | |
| | | සහාය වාදන ශිල්පීන්ගේ නම | සහාය දැක්වීම සඳහා කණ්ඩායමකට දෙදෙනෙකු බැගින් සහභාගි වන අයගේ නම් |
| 01 | ජන නැටුම් 07-10 | | 01 |
| 02 | | | |
| 03 | | | 02 |
| 04 | | | |
| 05 | ජන නැටුම් 11-14 | | 03 |
| 06 | | | |
| 07 | | | 04 |
| 08 | | | |
| 09 | ජන නැටුම්15-18 | | 05 |
| 10 | | | |
| 11 | | | 06 |
| 12 | | | |
| 13 | කෙටි නාට්‍ය | | 07 |
| 14 | | | |
| 15 | | | 08 |
| 16 | | | |

සකස් කළේ

අනුමත කළේ

.................................................

....................................

දිස්ත්‍රික් සමාජ සංවර්ධන කළමනාකරු

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ

ඇමුණුම් අංක **03**

## දිස්ත්‍රික් භාර නිලධාරී නාම ලේඛනය

| අනු අංකය | නිලධාරියාගේ නම | දුරකථන අංකය | දිස්ත්‍රික්කය |
|---|---|---|---|
| 01 | ඩබ්. එම්. දසනායක ලියනගේ මයා සමෘද්ධි කළමනාකරු | 0718146470 | හම්බන්තොට |
| | | | අනුරාධපුරය |
| | | | ත්‍රිකුණාමලය |
| 02 | ස්වර්ණා කාන්ති මෙය සමෘද්ධි කළමනාකරු | 0714065018 | ගම්පහ |
| | | | මහනුවර |
| 03 | ආර්. එම්. අයි. රාමනායක මිය සමෘද්ධි කළමනාකරු | 0716902827 | කළුතර |
| | | | ගාල්ල |
| | | | මාතර |
| 04 | ශ්‍රියානි අල්විස් මිය සමෘද්ධි කළමනාකරු | 0718014747 | කොළඹ |
| | | | පුත්තලම |
| | | | කුරුණෑගල |
| 05 | නිල්මා වසන්ති මිය සමෘද්ධි කළමනාකරු | 0716205253 | මාතලේ |
| | | | නුවර එළිය |
| | | | කෑගල්ල |
| | | | බදුල්ල |
| 07 | කුමුදු විජිත් මයා සමෘද්ධි කළමනාකරු | 0716345672 | මොණරාගල |
| | | | අම්පාර |
| | | | රත්නපුරය |
| 08 | පී.ආර්. ජයසුන්දර මහතා, සමෘද්ධි කළමනාකරු | 0786447070 | පොළොන්නරුව |
| 09 | වි. විජේන්ද්‍රන් සමෘද්ධි සංවර්ධන නිලධාරි | 0715862548 | යාපනය |
| | | | මඩකලපුව |
| | | | වව්නියාව |
| | | | මුලතිව් |
| | | | කිලිනොච්චි |
| | | | මන්නාරම |

**ඇමුණුම් අංක 04**

01. මෙතෙක් ප්‍රධාන කාර්යාලයට ලබා නොදුන් ළමා කතන්දර 2018.10.10 වන දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය. එදිනට පසු ලබාදෙන ළමා කතන්දර ජාතික තරඟාවලියට ඉදිරිපත් කිරීමට නොහැකි බව ද දන්වමි.

02. චිත්‍ර තරඟය සඳහා අවශ්‍ය කඩදාසිය පමණක් සපයන අතර අනෙකුත් දෑ තරඟකරුවන් විසින් රැගෙන ආ යුතුය.

03. සරල ගී ගායනය සඳහා පමණක් සහාය වාදනය සපයන අතර ශාස්ත්‍රීය ගායනය/වාදනය සඳහා ඒ ඒ තරඟකරුවන් විසින් වාදන භාණ්ඩ සපයා ගත යුතුවේ.

04. ගද්‍ය හා පද්‍ය රචනා තරඟ සඳහා තරඟ අවස්ථාවේදී මාතෘකා සහ කඩදාසි සපයනු ලැබේ.

05. කථික තරඟය සඳහා පහත පරිදි වයස් කාණ්ඩ අනුව මාතෘකා ලබා දීමට නියමිත වේ. දරුවන් තම වයස් කාණ්ඩයට අදාල මාතෘකා සියල්ලටම සූදානම් විය යුතු අතර තරඟය අවස්ථාවේදී තරඟකරුවන් විසින් එයින් අහඹු ලෙස තෝරා ගන්නා මාතෘකාව පිළිබඳ කථා කළ යුතුය.

**වයස් කාණ්ඩය 07-10**

- පරිසරය සුරකිමු.
- වැඩිහිටියන් හට සලකමු හැමවිට
- නිරෝගී දිවියකට යහපත් ආහාර පුරුදු

**වයස් කාණ්ඩය 11-14**

- මත් උවදුරින් නිදහස් අපේ පවුල.
- පොත් කියවීමෙන් ළමා පෞරුෂය ගොඩ නැගේ.
- ශ්‍රී ලංකාවේ අතීත ශ්‍රී විභූතිය තුළින් අනාගතය නිවැරදිව ගොඩ නගමු

**වයස් කාණ්ඩය 15-18**

- දේශීය ආහාර භාවිතයෙන් බෝනොවන රෝග වලින් වලකිමු.
- දිළිඳුකමින් මිදීමට පුද්ගල ආකල්ප කොතරම් ඉවහල් වේද?
- සමාජ මාධ්‍ය (Social Media) තුළින් වර්තමාන තරුණ පරපුරට සිදුවන යහපත් හා අයහපත් බලපෑම.

04. එදිනට පැමිණෙන නිලධරින්ගේ හා තරඟ ඉසව් සඳහා ඉදිරිපත්වන තරඟකරුවන්ගේ නම් හා අත්සන් සඳහා සැකසූ පත්‍රිකාව මෙහෙයුම් කාර්යාලයෙන් ලබා ගෙන, තරඟ ආරම්භයට පෙර එය නිවැරදිව සම්පූර්ණ කර භාරදීමට කටයතු කළ යුතුයි.

06. උපදෙස් පත්‍රිකාවට අනුව ඒ ඒ තරඟය සඳහා නියමිත කාලය පිළිබඳ මෙවර විශේෂයෙන් සැලකිලිමත් වන අතර අදාළ කාලය ඉක්මවන තරඟකරු හෝ තරඟකාරිය ඉවත් කිරීමට හේතුවේ.නර්තන අංශ සඳහා දරුවන් සජීවී ගායන ඉදිරිපත් කිරීම වැදගත් වන අතර පටිගත කරන ලද තාක්ෂණික උපාංග භාවිතයෙන් වැලකිය යුතුවේ.( සීඩී සහ පෙන් ඩ්‍රයිව්)

07. තරඟකරුවන් හදුනා ගැනීම සඳහා අදාළ තරඟකරුවන්ගේ නම් ඇතුලත් නිල ලාංඡනයක් තරඟය පැවැත්වීමට ප්‍රථම ඔබ දිස්ත්‍රික්කය භාර කළමණාකරු වෙත ලබා දෙනු ඇත. තරඟකරුවන් එය පැළඳගෙන පාසල් භූමියට පැමිණ ලියාපදිංචි වීම අනිවාර්ය වේ.